www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මාධ්‍යවේදියාගේ ඝාතනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා හමුදා නිලධාරින්ගෙන් ප්‍රශ්න කරයි

**Sri Lankan military personel questioned over murder of journalist**

**ඩබ්ලිව්. ඒ. සුනිල් විසිනි**
**2006 ජුලි 12**

නිදහස් මාධ්‍යවේදී සම්පත් ලක්මාල් ද සිල්වාගේ ඝාතනය සම්බන්ධව පසු ගිය සතියේ ශ්‍රී ලංකා හමුදාවේ බුද්ධි අංශ නිලධාරියෙකු සහ සොල්දාදුවෙකු රඳවා ගෙන ප්‍රශ්න කිරීම දිවයින යලි යුද්ධයකට ඇද දැමීම සඳහා සන්නද්ධ බලකායන්ගේ කූට උපක්‍රම පිලිබඳව තව දුරටත් ප්‍රශ්න මතු කරයි.

විසිතුන් හැවිරිදි සිල්වා ජුලි 1 ඝාතනය කරනු ලැබී ය. පොලිස් තොරතුරුවලට අනුව ඔහුගේ ඝාතකයන් ඔහුට මිලිමීටර් 9 පිස්තෝලයකින් වෙඩි හතරක් - එක් වරක් කනට සහ හිසට තුන් වරක් - තබා ඇති අතර ඔහුගේ සටහන් පොත සහ ජංගම දුරකථනය ගෙන ගොස් තිබේ. ඔහුගේ නිවසින් කිලෝමීටර් හතරක් පමන දුරින් පිහිටි ජනාකීර්න ප්‍රදේශයක් වන දෙහිවල ජයවර්ධන මාවතේ තිබී පසු දින ඔහුගේ මලසිරුර සොයා ගත්තේ ය.

මාධ්‍ය සංවිධාන ගනනාවක් විසින් ඝාතනයේ සැක සහිත ස්වභාවය පිලිබඳව ප්‍රශ්න මතු කිරීමෙන් පසු දෙහිවල පොලීසිය විසින් හමුදා බුද්ධි අංශ නිලධාරියෙකු අත් අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමෙන් පසු මුදා හැරියේ ය. ලංකාවේ පොලීසියේ සාමාන්‍ය ක්‍රියා පටිපාටිය වන්නේ සැකකරුවෙකු උසාවියට ඉදිරිපත් කරන තුරු රඳවා තබා ගැනීම යි. පොලීසිය බුද්ධි අංශ නිලධාරීන්ගේ නම් සඳහන් කර නැත.

හමුදා බුද්ධි අංශ නිලධාරීන් මෙන් ම සිංහල අන්තවාදී පක්ෂ දෙකක් - ජනතා විමුක්ති පෙරමුන සහ ජාතික හෙල උරුමය - සිල්වා කෙරෙහි අමනාපයෙන් සිටියහ.

සත්දින පත්‍රයේ ආරක්ෂක ලියුම්කරු ලෙස දූෂන සහ දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය සමග සම්බන්ධතා පැවැත්වීම ගැන බුද්ධි අංශ නිලධාරීන් විවේචනය කරමින් අද්මිරාල් යන ආරූඪ නමින් පසු ගිය වසරේ ඔහු ලිපි කීපයක් ම ලිවීය.

ජවිපෙ සහ ජාතික හෙල උරුමයේ මුදල් අක්‍රමිකතා සහ අභ්‍යන්තර ගැටුම් සම්බන්ධව ද ඔහු ලිපි ලිවීය.

හමුදා බුද්ධි අංශය සමග මෙන් ම සිංහල සහ දෙමල දේශපාලනඥයන් සහ එල්ටීටීඊ ක්‍රියාකාරීන් සමග ද සිල්වාට සම්බන්ධකම් පැවැති බව සත්දින නියෝජ්‍ය කර්තෘ ශ්‍රීලාල් ප්‍රියන්ත ලෝක සමාජවාදී වෙබ් අඩවියට පැවසුවේ ය. "හමුදා බුද්ධි අංශයේ මුදල් වංචා ගැන ලිවීමෙන් පසු හමුදා නිලධාරීන් විසින් පසු ගිය වසරේ ඔහු පැහැරගෙන ගොස් ඔහුට වධහිංසා කල" බව ඔහු පැවසී ය.

නැවත එබඳු ලිපි නොලියන ලෙස ඔහු පැහැරගෙන ගිය පුද්ගලයන් ඔහුට තර්ජනය කර තිබූ බව ප්‍රියන්ත පැවසී ය. පලිගැනීම පිලිබඳ භීතිය නිසා ඔහු ඒ සම්බන්ධව පොලීසියට පැමිනිල්ලක් නොකල අතර ඔහුගේ ප්‍රසිද්ධ ආරූඪ නමින් බුද්ධි අංශ දූෂන ගැන කිසිවක් තව දුරටත් නො ලිව්වේ ය.

ඉහත දී ඔහු සිංහල දිනපතා පත්‍රයක් වන ලක්බිම පත්‍රයේ සහ පෞද්ගලික රූපවාහිනී සේවාවක් වන ටීඑන්එල් රූපවාහිනියේ සේවය කලේ ය. මෑත දී ඔහු යලි පදිංචි කිරීමේ සහ පුනරුත්ථාපන අමාත්‍යංශයේ මාධ්‍ය ඒකකයට සම්බන්ධ විය.

ජුලි 1 රාත්‍රී 9ට පමන ඇගේ පුතාට දුරකථන ඇමතුමක් ලැබුන බව සිල්වාගේ මව ලෝක සමාජවාදී වෙබ් අඩවියට පැවසුවා ය. ඔහුට "කුමාර සර්" කතා කල බවත් එදින රාත්‍රියෙහි ලොකු වැඩක් කිරීමට ඇති බවත් ඔහු ඇයට කියා තිබේ. සිල්වාගේ මවට අනුව " කුමාර සර්" හමුදා බුද්ධි අංශයේ නිලධාරියෙකි. සිල්වා සිය මිතුරෙකු සමග ඒමට සූදානම් වූ නමුත් කතා කල තැනැත්තා ඔහුට තනිවම එන ලෙස උපදෙස් දී තිබේ.

ඝාතනයට හමුදාවේ සම්බන්ධතාවය පිලිබඳව ජුලි 8 පාර්ලිමේන්තුවේ දී තව දුරටත් ප්‍රශ්න මතු කෙරුනි.

තරුනයන් පස්දෙනෙකු අවිස්සාවේල්ලේ දී ඝාතනය කල අයගේ නම් සිල්වා දැන සිටි නිසා ඔහුව ඝාතනය කල බව හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයේ දී කතා කල එල්ටීටීඊ හිතවාදී දෙමල ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. කේ. සිවාජිලිංගම් ප්‍රකාශ කලේ ය.

තවත් මන්ත්‍රීවරු දෙදෙනෙක් - කඳුරට ජනතා පෙරමුණේ වී. රාධක්‍රිෂ්නා සහ එක්සත් ජාතික පක්ෂයේ රංගෙ බංඩාර - එම චෝදනාව නැගූ නමුත් සවිස්තර තොරතුරු ඉදිරිපත් කිරීමක් නො කලහ. ඝාතනයට සම්බන්ධ බවට සැක කෙරෙන හමුදා නිලධාරීන් අත් අඩංගුවට ගැනීමට නියෝග කර නැත්තේ  මන්දැයි රංගෙ බංඩාර ප්‍රශ්න කලේ ය.

දෙමල ජාතිකයන් ලෙස සැක කරනු ලබන මෙම තරුනයන් පස්දෙනා අතුරුදහන් වූයේ අප්‍රේල් 25 හමුදා මූලස්ථානයට එල්ල කෙරුන මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයෙන් පසුව සන්නද්ධ බලකායන් විසින් සිදු කල සෝදිසි මෙහෙයුම් දිනවල දී ය. ප්‍රධාන වසයෙන් හමුදා නිලධාරීන් ඇතුලුව 11 දෙනෙකු මරනයට පත් වූ මෙම ප්‍රහාරයේ දී හමුදාපති ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකා බරපතල ලෙස තුවාල ලැබී ය. තරුනයන් පස්දෙනාගේ හිසසුන් මලකඳන් අවිස්සාවේල්ලේ දී පසුව හමුවූහ. සිද්ධිය ගැන මුල් ප්‍රවෘත්තිවලට පසුව ඒ පිලිබඳව කිසිදු පොලිස් පරීක්ෂනයක් ගැන වාර්තා වී නැත.

පාර්ලිමේන්තුවේ දී මතු කල ප්‍රශ්නවලට ආන්ඩුව තවමත් ප්‍රතිචාර දක්වා නැති නමුත් සිල්වාගේ මරනය පිලිබඳ චෝදනාව එල්ටීටීඊය මත පැටවීමේ උත්සාහයක් තිබේ.

"ඔහු එල්ටීටීඊයට විරුද්ධව තදින් ලියූ අතර ඔවුන්ගේ ප්‍රචන්ඩ ක්‍රියාවන් හෙලා දුටු" බවට ජාතික ආරක්ෂක මධ්‍යස්ථානයේ ප්‍රකාශකයෙකු පැවසූ බව ආන්ඩුවේ ඩේලි නිව්ස් පුවත්පත උපුටා  දක්වී ය. සිල්වා හමුදාවට වැදගත් තොරතුරු සම්පාදනය කල බව ද එම වාර්තාවෙහි සඳහන් විය. කෙසේ නමුත් එම වර්තාවෙන් පසු ආන්ඩුව සහ ආන්ඩුවට අයත් ජනමාධ්‍ය ඝාතනය ගැන මුනිවත රකී.

ජූලි 4 ශ්‍රී ලංකා වෘත්තීය මාධ්‍යවේදීන්ගේ සංගමය (එස්එල්ඩබ්ලිව්ජේ) නිකුත් කල ප්‍රකාශයක මෙසේ සඳහන් වෙයි. "රට යලි යුද්ධයක අද්දරට තල්ලු කෙරී ඇති මෙම අවස්ථාවේ දී ලක්මාල්ගේ ඝාතනය, මාධ්‍යවේදීන් ස්වකීය ඉලක්කයන් බවට පත් කර ගනිමින් ඔවුන්ගේ විවිධ අරමුනු සාක්ෂාත් කර ගැනීමට විවිධ කන්ඩායම් විසින් මාධ්‍යවේදීන් ඉලක්ක කර ගෙන ඇති බව සනාථ වීමකි."

ඝාතකයන් සොයා දඬුවම් කරන ලෙස ඉල්ලමින් ශ්‍රී ලංකා වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ ශ්‍රී ලංකා දෙමල මාධ්‍ය සන්ධානය ඇතුලු මාධ්‍ය සංවිධාන ගනනාවක් ජූලි 6 කොලඹ දී සහ 7 නුවර දී විරෝධතා උද්ඝෝෂන දෙකක් පැවැත්වූහ.

ඔවුන් අත් අඩංගුවට ගැනීමෙන් පැයකට පසු හමුදා නිලධාරීන් නිදහස් කිරීම ගැන නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පසුව කනස්සල්ල ප්‍රකාශ කලේ ය. ජනාධිපති මහින්ද රාජපක්ෂ ගේ සහෝදරයෙක් වන ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ හමුවීමට නිදහස් මාධ්‍ය ව්‍යාපාරය උත්සාහ කල නමුත් එයට අවස්ථාවක් ලබා දී නැත. සන්ඩේ ලීඩර් පත්‍රයට අනුව සිල්වාගේ ජංගම දුරකථනයේ ඇමතුම් වාර්තා පරීක්ෂා කිරීම මගින් පොලීසිය සැකකරුවන් දෙදෙනා ගේ නම් සොයා ගෙන ඇත. මාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනයේ සභාපති ක්‍රිස්ටෝෆර් වොරන් ඝාතනය මෙසේ හෙලා දුටුවේ ය. "වාර්තා කිරීමේ දී අපක්ෂපාත වීම සම්බන්ධ සිල්වාගේ වාර්තාව නිසා මෙය විශේෂයෙන් ම කනගාටුදායක නිර්දය සහ අර්ථ විරහිත ප්‍රහාරයක්, මූලික නිදහස, ආරක්ෂක ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකාවේ දී මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව දුර්වල වීමක් මෙයින් තව දුරටත් ඇඟවුම් කෙරෙයි."

සිල්වාගේ ඝාතනය හුදෙකලා සිද්ධියක්  නොවේ. පසු ගිය මාස 16 තුල මාධ්‍යවේදීන් 6 දෙනෙකු සහ වෙනත් මාධ්‍ය සේවකයන්  ඝාතනය කරනු ලැබ ඇත. මෙම හැම සිද්ධියක දී ම හමුදාව සහ ඒ සමග වැඩ කරන අර්ධ මිලිටරි කන්ඩායම් එම ඝාතනවලට සම්බන්ධ බවට සැක කිරීමට බලගතු සාධක තිබේ.

ධර්මරත්නම් සිවරාම්ගේ ඝාතනය වඩාත් ප්‍රමුඛ ඝාතනවලින් එකකි. පසු ගිය වසරේ අප්‍රේල් 28 රාත්‍රියේ දී කොලඹ නගරයේ දී ඔහු පැහැරගෙන යනු ලැබී ය. පාර්ලිමේන්තු ගොඩනැගිල්ලෙන් මීටර් 500ක් මෙහා අධි ආරක්ෂිත කලාපයේ දී ඊට පැය කිහිපයකට පසුව ඔහුගේ මල සිරුර හමු විය. එල්ටීටීඊ ජාතිවාදී ටැමිල් නෙට් වෙබ්අඩවි කර්තෘ මන්ඩල සාමාජිකයෙකු වූ සිවරාම්ගේ ඝාතනය ආරක්ෂක බලකායන් හෝ සිංහල අන්තවාදී කන්ඩායම් විසින් කල බව විශ්වාස කිරීමට සියලු ම හේතු තිබේ. ඔහු "දෙමල කොටියෙක්" ලෙස හෙලා දැක තිබුන අතර "ඉදිරියේ දී රටට විරුද්ධ වන සියලු දෙනාට ම අනතුරු ඇඟවීමක් ලෙස" ජාතික හෙල උරුමය එය යුක්ති සහගත කලේ ය.

මෙම මැයි මාසයේ දී යාපනයේ  පල කරන දිනපතා පුවත්පතක් වන උදයන් පත්‍රයේ කාර්යාලයට කඩා වැදුනු තුවක්කුකරුවෝ එහි සේවකයන් දෙදෙනෙකු ඝාතනය කලහ. ආන්ඩුව වහාම ඝාතනය ගැන එල්ටීටීඊයට චෝදනා කල නමුත් හමුදාවේ සහයෝගය ඇතිව අර්ධ මිලිටරි කන්ඩායමක් විසින් ප්‍රහාරය එල්ල කල බව පත්‍රයේ අයිතිකරුවෝ සහ සේවකයෝ අවධාරනය කලහ. දෙමල ජනයාට එරෙහි ඔවුන්ගේ මර්දනකාරී විධික්‍රමයන් ගැන රටේ පාලක සන්ධානයේ හවුල්කරුවෙකු වන ඊලම් මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය සහ හමුදාව පත්‍රය විශේෂයෙන් ම විවේචනශීලී විය. මෙම සිද්ධීන් දෙක සම්බන්ධව ම කිසිවෙකුත් අත් අඩංගුවට ගෙන නැත.

මැත ම සිද්ධිය වූ සිල්වාගේ ඝාතනය සම්බන්ධව ද බැරෑරුම් පරීක්ෂනයක් සිදු නො කෙරෙනු ඇත. මරනයට මොහොතකට පෙර සිල්වා සමග සිටි හමුදා බුද්ධි අංශ නිලධාරීන්ගේ ගිනි අවි පරීක්ෂා කිරීමට

පොලීසිය තීන්දු කර ඇති බව ජුලි 10 ලක්බිම පත්‍රය වාර්තා කලේ ය. ඉදිරි දින කිහිපය තුල දී එය කරනු ඇතැයි වාර්තාවේ සඳහන් විය. මේ ගැන අවධානයෙන් සිටියොත්, ආයුධ අතුරුදහන් වී ඇතැයි කීවොත් එය කිසි සේත් ම පුදුමයට කරුනක් නොවනු ඇත. " විවිධ පාර්ශ්වයන්ගේ බල පෑම් නිසා පරීක්ෂන කන්ඩායම් අකර්මන්‍ය වී ඇති" බව පත්‍රය වාර්තා කලේ ය. එල්ටීටීඊය සම්බන්ධ බව තහවුරු කිරීමට තොරතුරු නැතැයි පොලීසිය ප්‍රකාශ කර තිබේ.

සිල්වාගේ ඝාතනය මගින් හමුදා බුද්ධි අංශය ඇඟවුම් කර ඇති කාරනය පුදුමයක් නො වේ. රට තුල යුද්ධය දිග් ගැස්සී මුලු කාලය පුරා ම බුද්ධි අංශය සෘජුව හෝ දෙමල අර්ධ මිලිටරි කන්ඩායම්වල සහාය ඇතිව ප්‍රකෝපකාරී ක්‍රියාවන්, මිනීමැරුම් සහ වෙනත් කැත මෙහෙයුම්වල යෙදී තිබේ. ඔවුන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධව පොලීසිය හෝ ආන්ඩුව බැරෑරුම් පරීක්ෂනයක් නොකරන තතු තුල දඬුවමක් නොලබා නිදැල්ලේ ඔවුන්ට ක්‍රියා කිරීමට හැකිව තිබේ.

© www.wsws.org